චක්‍රලේඛ අංක 10/2015

සමූපකාර සේවක කොමිෂන් සභාව,

උතුරු පළාත් සභාව,

35, අම්මන් වීදිය,

කන්දර්මඩම්,

යාපනය.

2015.07.29

උතුරු පළාතේ සියළුම සමූපකාර ආයතනවල සභාපතිවරුන් වෙත.

## ලිපිකරුවන් සඳහා අභ්‍යන්තර සීමිත උසස්වීම් පටිපාටිය

සමූපකාර සමිතිවල මෙහෙයුම් මට්ටමේ 17 වැනි වැටුප් පරිමාණයේ ඇතැම් තනතුරුවල සේවකයින්ට උසස්වීම් ලැබීම ප්‍රමාද වන බවත් ඇතැම් අවස්ථාවලදී නොලැබී යැමෙන් ඒ තුලින් ඔවුන්ට අසාධාරණනය සිදුවන බවත් දන්වන ලදී.

අදාල තනතුරුවල සේවකයින්ට කාර්‍යාලයේ උසස් වැටුප් පරිමාණයේ ලිපිකරු තනතුරු ලබාදීමට විධි විධාන සැලසීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

එම අදාල තනතුරු නම්

| | |
|---|---|
| මුරකරු | 315/17 |
| කාර්‍යාල කාර්‍ය සහායක | 317/17, 318/17, |
| පොත් බඳින්නා | 320/17, |
| මුද්‍රණාල කපන්නා | 321/17, |

ඉහත සඳසහන් තනතුරු දරන්නන් මුල් පත්වීම් දිනයේ සිට වර්ෂ 10 ක් 17 වැනි වැටුප් පරිමානයේ ස්ථිර පත්වීම් මත සේවය කර ඇත්නම් 16 වැනි වැටුප් පරිමානයේ ලිපිකරු තනතුරට උසස්වීම් ලැබිය හැකිය.

කාර්‍යාල කාර්‍ය සහායක 317/17 වැටුප් පරිමානයේ ස්ථිර සේවය වර්ෂයක්ද, 317/16 වැටුප් පරිමාණයේ ස්ථිර සේවය වර්ෂ 09 ක්ද තිබේනම් (සම්පූර්ණව වර්ෂ 10 ක්) පමණක් 15 වැනි වැටුප් පරිමාණයේ ලිපිකරු තනතුර උසස්වීම් ලැබිය හැකිය.

මේ සඳහා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සෑම වර්ෂයකදීම ජනවාරි මස අයදුම් පත් කැඳවා වර්ෂයේ මැද භාගයට පෙර විභාගය පවත්වා ප්‍රතිඵලය අනුව උසස් කිරීමට කොමිෂන් සභාව අනුමැතිය ලබා දෙයි. ( සමත්වීමේ ලකුණු - 40 යි) විභාගය සඳහා අයදුම්කරු ගාස්තුවක් ගෙවා ඒ සඳහා වන කුවිතාන්සිය යාකල යුතුය. විශේෂයෙන් සමූපකාර සමිති පුරප්පාඩු ඇත්නම් පමණක් අයදුම් පත් නිර්දේශ කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතුය. අයදුම් පතක ආදර්ශය ඇමුණුම් 1 වශයෙන් පෙන්නුම් කර ඇත.

2015.07.27 දිනැති කොමිෂන් සභාවේ තීරණය පරිදි.

අත්සන

පී. වාකීසන්, P.VAGESHAN
Secretary

ලේකම්. Co-operative Employees Commission
Northern Provincial Council

ඇමුණුම් 1

# ආදර්ශ අයදුම් පත

## ලිපිකරු තනතුර සඳහා අභ්‍යන්තර සීමිත උසස්වීම් පටිපාටිය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :-

2. ජාතික හැඳුනුම් පත් අංකය :-

3. උපන් දිනය:-

4. සමූපකාර සමිතියේ නම :-

    4.1 වර්තමාන තනතුර :-

    4.2 තනතුරේ සංකේත අංකය :-

5. 5.1 වර්තමාන තනතුර ස්ථිර කරන ලද දිනය :-

    5.2 අයදුම් කිරීමේ අවසාන දිනයේදී අදාල තනතුරේ

    සමූපකාර සේවා කාලය වර්ෂ ........ මාස .......... දින ..........

ඉහත සඳහන් තොරතුරු සියල්ල සත්‍ය බවත්, මම විභාගයෙන් සමත් වුවහොත් ලිපිකරු තනතුර භාර ගෙන කටයුතු කරන බවත් සහතික කරමි. එසේම අදාල විභාග ගාස්තුව ගෙවූ බවට ලදුපත (ලදු පත් අංකය............... ) පහත අමුණා ඇත.

......................................

අයදුම්කරුගේ අත්සන.

| ලදු පත මෙහිදී අමුණා ඇත. |
|---|

**2. සභාපතිගේ නිර්දේශය**

අදාල අයදුම්කරු ............................................................ මයා/මිය/මෙනවිය මාගේ සමිතියේ ................. වැනි වැටුප් පරිමාණයේ ස්ථිර පත්වීම ලැබ වරෂ 10 ක් සම්පූර්ණ කරන ලද සේවකයෙකු වේ. මොහු සීමිත තරග විභාගයේදී සමත් වුවහොත් මහු මාගේ සමිතියේ පුරප්පාඩුව පවතින ලිපිකරු 302/16 හෝ 302/15 (අදාල නොවන එක කපා හරින්න) යන තනතුරට උසස් කරන බව සහතික කරමි. මොහුගේ අයදුම් පත නිර්දේශ කර සමූපකාර සේවක කොමිෂන් සභාවට ඉදිරිපත් කරමි.

....................................

දිනය: .........................

සභාපතිගේ අත්සන

නිල මුද්‍රාව